**ශීර්ෂය 007 අධිකරණ සේවා කොමිෂන් සභාව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 007 - අධිකරණ සේවා කොමිෂන් සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අධිකරණ සේවා කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව සභාවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 ජුනි 19 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට අධිකරණ සේවා කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තරකර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතු ය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උපවගන්තිය ප්‍රකාරව සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කළ සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු ය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණයකර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම්කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම් ඉදිරිපත් කිරීම

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 නොවැම්බර් 30 දිනැති අංක 05/2023 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ 3.1 ඡේදය ප්‍රකාරව CIGAS වෙබ් යෙදුම් පද්ධතියෙන් ලබාගත් අවසාන භාණ්ඩාගාර මුද්‍රිත මූල්‍ය ප්‍රකාශනයට අමුණා තිබිය යුතු වුවත්, SA 12, SA 20,SA 40, SA 90 මුද්‍රිත ඉදිරිපත්කර නොතිබුණි. | SA 12 ඇතුළත් තොරතුරු SA xxx ප්‍රකාශනයේ විස්තරාත්මකව ඇතුළත් වන බැවින්, SA 12 මූල්‍ය ප්‍රකාශනයේ අමුණා නොතිබූ අතර SA 12 හා SA 90 පිටපත් ඇමුණුම් 01, 02, මඟින් ඉදිරිපත් කරන බව දන්වා තිබුණි. | යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන සමඟ භාණ්ඩාගාර මුද්‍රිත ඉදිරිපත් කළ යුතු ය. |
| (ආ) | 2023 නොවැම්බර් 30 දිනැති අංක 05/2023 රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ ඡේද 6 හි ඒසීඒ 5 ආකෘතිය අනුව පිළියෙල කරනු ලබන, 2023 දෙසැම්බර් 31 දිනට අත්තිකාරම් ගිණුම් පිළිබඳ ප්‍රකාශනයේ (ඒසීඒ -5 ) භාණ්ඩාගාර මුද්‍රිත (SA52) අනුව සටහන් කළ යුතු වුවත්, වර්ෂය තුළ හර කිරීම් සහ බැර කිරීම් (11 හා 12 යටතේ) වටිනාකම් නිවැරදිව සටහන්කර නොතිබුණි. | ඒ.සී.ඒ. 05 අත්තිකාරම් ගිණුම් පිළිබඳ ප්‍රකාශනයේ හා S.A. 52 භාණ්ඩාගාර මුද්‍රිත ප්‍රකාශයේ සටහන් අනුව හර හා බැර කිරීම්වල වෙනස්කම් පවතින බව දක්වා ඇතත් එවැනි වෙනස්කම් නොමැති බව දන්වා තිබුණි. | අත්තිකාරම් ගිණුම් පිළිබඳ ප්‍රකාශනයේ ශේෂ නිවැරදිව දැක්විය යුතු ය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 වර්ෂයේ අපහරණය කරන ලද භාණ්ඩ විකිණීමෙන් ලද රු.21,700 ක වටිනාකම 20–03–01-00 (දෙපාර්තමේන්තුමය විකුණුම්) යන ආදායම් සංකේතය යටතේ දැක්විය යුතු වුවත්, 20–06–02–02 (වෙනත්) යන ආදායම් සංකේතය යටතේ දක්වා තිබුණි. | 2023 වර්ෂයේ අපහරණය කරන ලද භාණ්ඩ විකිණීමෙන් ලද ආදායමෙන් රු.21,700 ක මුදල 2003.01.00 යටතේ ගිණුම්ගත කළ යුතු අතර, එය ඉදිරියේදී නිවැරදි කරනු ලබන බව දන්වා තිබුණි. | ආදායම් නිවැරදිව වර්ගීකරණයකර දැක්විය යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | වර්ෂය තුළ අපහරණය කරන ලද රු.31,279 ක් වූ සන්නිවේදන උපකරණ විකිණීමෙන් ලද ආදායම වූ රු.1,000 ක වටිනාකම මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ හිමිකම් ඉවත් කිරීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම යටතේ දැක්විය යුතු වුව ද, එය මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ දක්වා තිබුණි. | 2023 වර්ෂයේ භාණ්ඩ අපහරණය කිරීමෙන් ලද මුළු මුදල 20.06.02.02 යටතේ ගිණුම්ගතකර තිබූ බැවින්, රු.1,000 ක මුදල මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණු අතර, එය ඉදිරි වර්ෂයේ සිට නිවැරදි කරන බව දන්වා තිබුණි. | වත්කම් විකිණීමෙන් ලද ආදායම මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ නිවැරදිව දැක්විය යුතු ය. |

## 2.2 වියදම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පුනරාවර්තන වැය විෂයයන් 08 කට හා මූලධන වැය විෂයයන් 02 ක් සඳහා ප්‍රතිපාදිත රු.26,120,000 කින් රු.10,923,533 ක් ඉතිරිවී තිබූ අතර, එම ඉතිරිවීම් සියයට 26 සිට සියයට 99 ක පරාසයක්ගෙන තිබුණි. | අයවැය චක්‍රලේඛ අංක 01/2023 අනුව වියදම් දැඩි පාලනයකට ලක්කිරීම තුළින් හා නිසි කළමනාකරණය සහ රජයේ මුදල් උපරිම කාර්යක්ෂමතාවයකින් සඵලදායීව විචක්ෂණශීලී මනා මූල්‍ය පාලනයකින් යුතුව භාවිතාකර ඇති බව දන්වා තිබුණි. | ප්‍රමාණවත් පරිදි ඇස්තමේන්තු සකස් කළ යුතු ය. |
| (ආ) | 2023 ජනවාරි 27 දිනැති අංක 01/2023 දරන අයවැය චක්‍රලේඛයේ 02 (ඇ) (ii) ඡේදය ප්‍රකාරව 1403 සඳහා වියදම් අවම කළ යුතු වුවත්, 1403 වැය විෂයය සඳහා රු.1,000,000 ක් එනම් සියයට 48 ක් මුදල් රෙගුලාසි 66 මාරු කිරීම් මගින් ප්‍රතිපාදන ලබාගෙන වියදම් දරා තිබුණි. | 2023 වර්ෂය සඳහා ඇස්තමේන්තු සකස් කරන විට තිබූ ගාස්තු ප්‍රමාණයන්ට වඩා වැඩි ප්‍රතිශතයකින් විදුලිය හා ජලය සඳහා ගාස්තු වැඩිවීම මත 1403 වැය විෂයය සඳහා අයවැය අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය මත මු.රෙ. 66 යටතේ ප්‍රතිපාදන මාරු කරන ලද බව දන්වා තිබුණි. | යොමුගත චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

## 2.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රකාශනය තුළ ඇතුළත් දෙසැම්බර් 31 දිනට බැරකම් පිළිබඳ ප්‍රකාශනයට අනුව රු.407,682 ක බැරකම් පැවතිය ද, භාණ්ඩාගාර මුද්‍රිත SA 92 හි එම බැරකම් වාර්තාකර නොතිබුණි. | 2023 දෙසැම්බර් 31 දිනට බැරකම් ශේෂය වන රු.407,682 නිවැරදි වන අතර, භාණ්ඩාගාර මුද්‍රිත SA 92 වාර්තාව භාණ්ඩාගාරය මගින් මේ වනවිට සකසා නොමැති බැවින්, ඒ සම්බන්ධයෙන් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව දැනුවත් කළ අතර, එය නිවැරදිකර නැවත කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන බව දන්වා තිබුණි. | බැරකම් නිවැරදිව භාණ්ඩාගාර මුද්‍රිතවල දැක්විය යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2023 නොවැම්බර් 30 දිනැති අංක 05/2023 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 3.3 ඡේදය අනුව ආයතනයේ බැඳීම් හා වගකීම් හෙළිදරව් කළ යුතු වුවත්, 2023 වර්ෂයට අදාළ රු.9,000 ක් වූ බැරකම්, බැරකම් ලේඛනයේ සහ 2023 දෙසැම්බර් 31 දිනට බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශනයේ ඇතුළත් කර නොතිබීම හේතුවෙන් එම වටිනාකමින් බැරකම් අඩුවෙන් දක්වා තිබුණි. | දෙසැම්බර් මාසයට අදාළ ඇගයීම් දීමනා සහ අතිකාල දීමනා සම්බන්ධයෙන් 2023 දෙසැම්බර් 31 දිනෙන් පසුව අදාළ අනුමැතිය ලබාගන්නා ලද බැවින්, 2023 දෙසැම්බර් 31 දිනට වවුචර් ඉදිරිපත් නොවීම හා බැරකම් CIGAS මෘදුකාංගයට ඇතුළත් කිරීම ජනවාරි 31 ට පෙර කළ යුතු බැවින්, රු.37,523 ක මුදල බැරකම් ලෙස ඇතුළත්කර නොමැති බව දන්වා තිබුණි. | යොමුගත චක්‍රලේඛ ප්‍රකාරව නිවැරදි බැරකම් මූල්‍ය ප්‍රකාශනයේ හා බැරකම් ලේඛනයේ දැක්විය යුතු ය. |

## 2.4 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදුකළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතිකවීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතුකර නොතිබුණි.

| | **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (i) | කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කළ සමාලෝචනය සිදුකර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කරගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදුකර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදුකළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත්කර නොතිබුණි. | කාර්යාලය තුළ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන ක්‍රමයක් ස්ථාපනය වෙනුවෙන් සෑම වසරක් පාසාම වර්ෂය ආරම්භයේදී ම ලිඛිතව, විගණන අංශයට ද පිටපතක් සහිතව බලය පැවරීම සිදු කරන අතර, වර්ෂය පුරා අඛණ්ඩව එහි සඵලදායීතාවය පිළිබඳ විමසිල්ලෙන් පසුවන බවද, බලතල පවරන ලද නිලධාරියෙකු විදේශ නිවාඩු ලබාගත් අවස්ථාවේදී වෙනත් නිලධාරියෙකු වෙත බලතල පැවරීම් සිදුකරන ලද බව ද, දන්වා තිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ii) | වාර්ෂික සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍යතා වේලාවන් ඇතුළත පිළියෙල කිරීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු අතර**,** ඊට අමතරව විගණනය කරනු ලබන ආස්ථිත්‍යයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වගබලාගත යුතු වුවත්**,** වාර්තාවේ 3.2 (අ) ඡේදයේ සඳහන් විගණන නිරීක්ෂණය හේතුවෙන් එම අවශ්‍යතා ඉටු කර නොතිබුණි. | COVID 19 වසංගත තත්ත්වය සහ ආර්ථික අර්බුදය හේතුවෙන් නඩු පිළිබඳ සංඛ්‍යා ලේඛන රැස් කිරීමේ ප්‍රමාදය නිසා 2020, 2021 හා 2022 වර්ෂයන්ට අදාළ කාර්යසාධන වාර්තා නියමිත කාලසීමාවේදී ඉදිරිපත් කිරීමට නොහැකි වූ බවත්, 2022 වර්ෂයේ කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු සූදානම් කර ඇති බව දන්වා තිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

**2.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහකර දැක්වේ.

| | නිරීක්ෂණය | | | ප්‍රධාන ගණන්දීමේ | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | **නීති,රීති හා රෙගුලාසිවලට යොමුව** | **වටිනාකම රු.** | **අනුකූල නොවීම** | **නිලධාරීගේ අදහස් දැක්වීම** | |
| (i) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | | |
| | 139 (4) | 722,594 | මුදල් රෙගුලාසි ප්‍රකාරව ගෙවනු ලබන සෑම මුදලකටම විධිමත් කුවිතාන්සියක් ලබාගත යුතු වුව ද, ගෙවීම් වවුචර් 16 ක් සම්බන්ධයෙන් එසේ කර නොතිබුණි. | ජල බිල්පත්, දුරකථන බිල්පත් ආදී උපයෝගිතා බිල්පත්වලට අදාළ මුදල් ගෙවීම්වලට අදාළ කුවිතාන්සි ඊට අදාළ ලිපිගොනුවේ ගොනුගත කර තිබූ අතර, ඒවා වවුචර්පත් සමඟ අමුණා තැබීමට පියවර ගන්නා ලද බව දන්වා තිබුණි. | යොමුගත මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| | 262 (2), (3) | 2,952,757 | මුදල් රෙගුලාසි ප්‍රකාරව ගෙවන ලද සියලුම වවුචර්වලත් ඒවා තහවුරු කරන ලියවිලිවලත් ″ගෙව න ලදී″ මුද්‍රාව යොදා තම කෙටි අත්සන | ගෙවීම් කරන සියලු ම වවුචර්වල “ගෙව්වා” මුද්‍රාව මත කෙටි අත්සන තබා ඇති අතර, ගෙවීම තහවුරු කරන අනෙකුත් ලියවිලිවල “ගෙවන ලදී” මුද්‍රාව පමණක් තබා ඇති අතර | යොමුගත මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| | යෙදිය යුතු නමුත්, ගෙවීම් වවුචර් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතුකර නොතිබුණු අවස්ථා 28 ක් විය. | එකී ලියවිලිවල ද නියමිත කෙටි අත්සන යෙදීමට පියවරගන්නා ලද බව දන්වා තිබුණි. | |
| 1645 | මුදල් රෙගුලාසි ප්‍රකාරව වාහන සම්බන්ධයෙන් දෛනික ධාවන සටහන් මාණ්ඩලික නිලධාරියෙක් හෝ වගකිව යුතු වෙන යම් නිලධාරියෙකු නිතිපතා පරීක්ෂා කළ යුතු වුව ද, දෛනික ධාවන සටහන්වල පහත අඩුපාඩු පැවතුණි. | | යොමුගත මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| | • රථයකට අදාළව දෛනික ධාවන සටහන්වල ඉන්ධන තුලනය කිරීම් සිදුකර තිබූ නමුත් ඇතැම් අවස්ථාවල වාහන භාර නිලධාරියා අත්සන්කර නොතිබුණි. | රථයේ ඉන්ධන තුලනය කිරීම සිදු කර තිබුණ ද, වාහන භාර නිලධාරියා විසින් අත්සන් තබා නොමැති ස්ථානවල මේ වන විට අත්සන් තබා ඇති බව දන්වා තිබුණි. | |
| | • වාහන 03 කට අදාළව දෛනික ධාවන සටහන්වල ඉන්ධන තුලනය කිරීම් අවස්ථා කිහිපයකදීම අධිකාරි බලයකින් තොරව වෙනස් කිරීම් සිදුකර තිබුණි. | වාහන 03 ට අදාළ දෛනික ධාවන සටහන්වල ඉන්ධන තුලනය කිරීම් අවස්ථා කිහිපයකදී අධිකාරී බලයකින් තොරව වෙනස්කර ඇති බව දන්වා තිබුණ ද, ඒවා ගණිතමය දෝෂයන් නිවැරදි කිරීම | |
| | • දෛනික ධාවන | | |

| | | | | |
|---|---|---|---|---|
| | | සටහන් තුළ අදාළ ගමන් වාරය අවසානයේදී වාහනය පාවිච්චි කරන ලද නිලධාරියා විසින් අත්සන් කළ යුතු නමුත්, වාහන 03 කට අදාළව ගමන් වාරය අවසානයේදී, අවස්ථා කිහිපයකදී රියදුරා විසින්ම අත්සන්කර ඇති අතර, ඇතැම් අවස්ථාවලදී වාහනවල ගමන් වාරය අවසානයේදී භාවිතා කරන ලද නිලධාරියා අත්සන්කර නොතිබුණි. | සඳහා කරන ලද වෙනස් කිරීම් පමණක් බව දන්වා තිබුණි.<br><br>මෝටර් රථ 03 ට අදාළ ගමන් වාරය අවසානයේදී සමහර අවස්ථාවලදී පමණක් රියදුරු විසින් ම අත්සන්කර ඇති අතර, එසේ රියදුරු විසින් අත්සන් තබන ලද සියලුම අවස්ථා අත්‍යාවශ්‍යම රාජකාරී ගමන් බවට සහතික කරන අතර, එම වාහනවල ගමන් වාරය අවසානයේදී භාවිතා කරන ලද නිලධාරියා අත්සන්කර නොමැති ස්ථානවල මේ වන විට අත්සන් තබා ඇති බව දන්වා තිබුණි. | |
| (ii) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ<br>2008 ජුනි 26 දිනැති අංක 13/2008 දරන චක්‍රලේඛයේ 03 ඡේදය | වාහන දෙකක් සම්බන්ධයෙන් චක්‍රලේඛය ප්‍රකාරව මාසික වාර්තාව පිළියෙල කර නොතිබුණි. | ලේකම්තුමාට සහ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්තුමාට විශාල භාරදූර කාර්යයන් පැවරී ඇති බැවින්, වාහන ධාවන සටහන් දෛනිකව නඩත්තු කිරීමට හැකියාවක් නොමැති බව දන්වා තිබුණි. | යොමුගත චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| | 2008 පෙබරවාරි 06 දිනැති සහ 2018 ජනවාරි 24 දිනැති අංක 05/2008 සහ | පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය හඳුන්වාදීම සෑම රාජ්‍ය ආයතනයක් විසින් සිදු කළ යුතුව තිබුණ ද, කොමිෂන් | අදාළ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ප්‍රකාරව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය හඳුන්වාදීමට කටයුතු කරමින් පවතින බව දන්වා | යොමුගත චක්‍රලේඛ පරිදි කටයුතු කළ යුතු ය. |

| | | | | |
|---|---|---|---|---|
| | 05/2008 (i) දරන චක්‍රලේඛ | සභාව විසින් පුරවැසි/ සේවාලාභි ප්‍රඥප්තිය හඳුන්වාදීම සිදුකර නොතිබුණි. | තිබුණි. | |
| (iii) | රාජ්‍ය මුදල් චක්‍රලේඛ | | | |
| | 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන චක්‍රලේඛයේ 04 ඡේදය | • චක්‍රලේඛය ප්‍රකාරව ඉදිරි වර්ෂයේ පුනරාවර්තන හා ප්‍රාග්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා වන වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රවර්ථන වර්ෂයේ දෙසැම්බර් 10 දිනට පෙර සකස් කොට ඒ සඳහා ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අනුමැතිය ලබාගෙන එහි පිටපත් ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව, විගණකාධිපති සහ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත යොමු කළ යුතු ය. නමුත් කොමිෂන් සභාව 2023 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා විසින් 2023 පෙබරවාරි 01 අනුමත කර තිබුණු අතර, විගණකාධිපති | 2023 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම 2023 පෙබරවාරි 01 දින අනුමත කර 2023 ඔක්තෝබර් 09 දින එහි පිටපත් විගණකාධිපති සහ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇති බවත්, 2024 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම නියමිත දිනට පෙර අනුමත කර එහි පිටපත් අදාළ ආයතන වෙත යොමුකර ඇති බව දන්වා තිබුණි. | යොමුගත චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| | වෙත 2023 ඔක්තෝබර් 10 දින ඉදිරිපත්කර තිබුණි. | | |
| | • චක්‍රලේඛය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන මාර්ගෝපදේශයේ අංක 13 හි ඇතුළත් සවිස්තර ප්‍රසම්පාදන සැලැස්ම, ඉදිරිපත් කරන ලද ප්‍රසම්පාදන සැලැස්මේ ඇතුළත්කර නොතිබුණි. | මුළු වසර සඳහා ම එකවර සවිස්තර ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම ප්‍රායෝගික නොවන බැවින් 2024 වර්ෂයේදී එක් එක් ප්‍රසම්පාදන කාර්යය ආරම්භයේදී ප්‍රසම්පාදන සැලැස්මට අනුකූලව ඊට අදාළ සවිස්තර ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | යොමුගත චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| | • චක්‍රලේඛය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් ප්‍රවර්තන වර්ෂයේ පුනරාවර්තන වැඩසටහන් සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | 2023 වර්ෂයේ ප්‍රාග්ධන වැඩසටහන පමණක් ඇතුළත්කර වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකසා ඇති අතර, 2024 වර්ෂයේ ප්‍රාග්ධන හා පුනරාවර්තන වැඩසටහන් ඇතුළත්ව ප්‍රසම්පාදන සැලැස්ම සකස් කොට ඇති බව දන්වා තිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

| | | | | |
|---|---|---|---|---|
| (iv) | වත්කම් කළමනාකරණ චක්‍රලේඛ<br><br>2017 දෙසැම්බර් 21 දිනැති අංක 02/2017 දරන චක්‍රලේඛයේ 02 (i) ඡේදය | අධිකරණ අමාත්‍යාංශය විසින් කොමිෂන් සභාව වෙත ලබාදී තිබුණු නිලරථ දෙකක් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අධිකරණ අමාත්‍යාංශ ලේකම් විසින් මෙම රථ දෙකෙහි ලියාපදිංචි අයිතිය කොමිෂන් සභාව වෙත පවරාදීමට අවශ්‍ය නොවන බවත්, රථ දෙකෙහි නඩත්තු කටයුතු පමණක් 2024 වර්ෂයේ සිට මෙම කාර්යාලය මගින් සිදු කරන ලෙස දන්වා තිබුණි. | යොමුගත චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

**2.6 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 01 / 2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි 371 (2) ප්‍රකාරව කිසියම් විශේෂිත කාර්යයන් සඳහා ලබාදෙන අතුරු අග්‍රිම දින 10 ක් ඇතුළත නැවත පියවිය යුතු වුවත්, අවස්ථා 04 කදී ලබාදුන් රු.98,000 ක් වටිනාකමැති අතුරු අග්‍රිම පියවීමේ කාලප්‍රමාදය දින 13 ත් දින 14 ත් අතර විය. | සියලු ම අත්තිකාරම්, මුදල් රෙගුලාසි 371 (2) අනුව අදාළ කාර්යය අවසන් කළ වහාම පියවා ඇති බව දන්වා තිබුණි. | යොමුගත චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි ප්‍රකාරව අතුරු අග්‍රිම කාල ප්‍රමාදයකින් තොරව පියවිය යුතු ය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 සැලැසුම් කිරීම**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය 03 ඡේදය ප්‍රකාරව ඉදිරි වර්ෂය සඳහා වන වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම ප්‍රවර්තන වර්ෂයේ දෙසැම්බර් 15 දිනට පෙර සකස් කර ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා වෙත ඉදිරිපත්කර අනුමැතිය ලබාගත යුතු වුවත්, 2023 වර්ෂයට අදාළ ක්‍රියාකාරී සැලැස්ම 2023 පෙබරවාරි 01 දින අනුමතකර තිබුණි. | 2023 වර්ෂයට අදාළ ක්‍රියාකාරී සැලැස්ම 2023 පෙබරවාරි 01 දින අනුමත කර තිබුණු බවත්, රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 අනුව 2024 වර්ෂයට අදාළ ක්‍රියාකාරී සැලැස්ම නියමිත දිනට අනුමතකර ඇති බව දන්වා තිබුණි. | යොමුගත චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාර කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ඉහත චක්‍රලේඛය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන මාර්ගෝපදේශයේ අංක 12 (ආ) හි සඳහන් වගකීම් ක්ෂේත්‍රය, වගකිව යුතු නිලධාරියා සහ ප්‍රතිදානය (Out put) සම්බන්ධයෙන් විස්තර, පිළියෙල කරන ලද ක්‍රියාකාරී සැලැස්ම තුළ අන්තර්ගත කර නොතිබුණි.තවද, ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කාලරාමුව මාසිකව ඉදිරිපත් කළ යුතු නමුත්, ඉදිරිපත්කර තිබූ ක්‍රියාකාරී සැලැස්මේ නිශ්චිතව කාලරාමුව හඳුනාගෙන නොතිබුණි. | 2023 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් නොවූ වගකීම් ක්ෂේත්‍රය, වගකිව යුතු නිලධාරියා සම්බන්ධ විස්තර ඇතුළත් කරමින් 2024 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම සකස් කර ඇති බවත්, කාලරාමුව අවස්ථානුකූලව වසර පුරා ක්‍රියාත්මක වන අතර, එය මාසිකව දැක්වීම ප්‍රායෝගික නොවන බවත් දන්වා තිබුණි. | යොමුගත චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාර කටයුතු කළ යුතු ය. |
| (ඇ) | 2023 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මට අනුව ප්‍රාග්ධන වියදම් සඳහා රු.500,000 ක් සැලැසුම්ගතකර තිබූ නමුත්, සමාලෝචිත වර්ෂය තුළ සත්‍ය ප්‍රාග්ධන වියදම රු.201,810 ක් විය. ඒ අනුව ප්‍රසම්පාදන සැලැස්මට අනුව සියයට 60 ක මිලදී ගැනීම් සිදුකර නොතිබුණු අතර, කොමිෂන් සභාව විසින් සැලැසුම් සකස් කිරීමේදී තාත්ත්වික තත්ත්වය සැලකිල්ලට ගෙන නොතිබුණි. | 2023 ප්‍රසම්පාදන සැලැස්ම අනුව මිලදීගත යුතු ඩෙස්ක්ටොප් මොනිටර් යන්ත්‍ර 05 ක් වර්ෂය අවසානයේදී මිලදීගත් අතර, භාණ්ඩාගාර අග්‍රිම නොලැබීම මත ගෙවිය යුතු රු.125,000 ක මුදල 2023 දෙසැම්බර් 31 දිනට බැරකම් ලෙස දක්වා ඇත. එබැවින් එම මුදල මෙම වියදමට ඇතුළත් නොවේ. අයවැය චක්‍රලේඛ 02/2023 අනුව වියදම් අවම කිරීම සඳහා අබලන්ව පැවති Multifunctional Fax යන්ත්‍රය අලුත්වැඩියා කර භාවිතයට ගැනීම නිසා මෙම තත්ත්වය ඇති වී තිබෙන බව දන්වා ඇත. | ප්‍රසම්පාදන සැලැස්ම නිවැරදි ලෙස හා වඩාත් තාත්ත්විකව සකස් කළ යුතු ය. |

**3.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කළ යුතුව තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12.1 ඡේදය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ගත වීමට ප්‍රථම සභාගත කිරීම සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු වුවත්, 2020, 2021 වර්ෂවල කාර්යසාධන වාර්තා 2023 මාර්තු 26 දින | 2020, 2021 හා 2022 වර්ෂයන්ට අදාළ කාර්යසාධන වාර්තා නියමිත කාලසීමාවේදී ඉදිරිපත් කිරීමට නොහැකි වූ බවත්, 2022 වර්ෂයේ කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු සූදානම් කර ඇති බව දන්වා තිබුණි. | යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව කාර්යසාධන වාර්තාව නියමිත දිනට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| | පාර්ලිමේන්තුව වෙත සභාගත කිරීම සඳහා ඉදිරිපත්කර තිබුණි. ඒ අනුව 2020 වර්ෂයේ කාර්යසාධන වාර්තාව සඳහා වර්ෂ 01 මාස 09 ක කාල ප්‍රමාදයක් හා 2021 වර්ෂයේ කාර්යසාධන වාර්තාව සඳහා මාස 08 ක කාලප්‍රමාදයක් පැවතුණි. එමෙන්ම 2022 වර්ෂයේ කාර්යසාධන වාර්තාව වාර්තාවේ දින වන විටත් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කර නොතිබුණු අතර, ඒ සඳහා වර්ෂ 01 මාස 01 ක කාලප්‍රමාදයක් පැවතුණි. | | |
| (ආ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය ප්‍රකාර මූල්‍ය ප්‍රකාශන සමඟ වාර්ෂික කාර්යසාධන වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. | 2020, 2021 හා 2022 වර්ෂයන්ට අදාළ කාර්යසාධන වාර්තා නියමිත කාලසීමාවේදී ඉදිරිපත් කිරීමට නොහැකි වූ බවත්, 2022 වර්ෂයේ කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු සූදානම් කර ඇති බව දන්වා තිබුණි. | යොමුගත චක්‍රලේඛය හා පනත ප්‍රකාරව කාර්යසාධන වාර්තාව නියමිත දිනට ඉදිරිපත් කළ යුතු ය. |

**3.3 වත්කම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 හි ඡේද අංක 11.1 ප්‍රකාරව, මුදල් රෙගුලාසි 756 (6) ඡේදය අනුව භාණ්ඩ සමීක්ෂණය සිදු කර අවසන් කළයුතු කාලරාමුව අනුව භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයක් පත් කිරීම අදාළ වර්ෂයේ දෙසැම්බර් 15 ට පෙර සිදුකළ යුතු වුවත්, 2023 වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය 2024 ජනවාරි 04 දින පත්කර තිබුණි. | 2023 වර්ෂයේ කොමිෂන් සභාවේ භාණ්ඩ සමීක්ෂණය පැවැත්වීම සඳහා 2023 නොවැම්බර් 29 වන දින අනුමැතිය ලබාගෙන තිබුණ ද, භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයේ තුන්වන සාමාජිකයා පත්කිරීම ප්‍රමාද වීම හේතුවෙන් භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය පත්කිරීම ප්‍රමාද වූ බව දන්වා තිබුණි. | යොමුගත චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි ප්‍රකාරව කාලරාමුවට අනුව භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල පත්කළ යුතු ය. |

## 3.4 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 දෙසැම්බර් 09 දින මෝටර් රථයක් හානියට පත්වීම සම්බන්ධයෙන්, මුදල් රෙගුලාසි අංක 103 (1) (ඉ) ප්‍රකාරව හානිවීම් ලේඛනයෙහි සටහන් කළ යුතු නමුත් මෙම හානිය, එහි ඇතුළත්කර නොතිබුණි. | මෝටර් රථයකට රාත්‍රී කාලයේදී සතෙක් සීරීම මත හානියක් සිදු වූ අතර, එම අලුත්වැඩියාව සඳහා වැය වූ රු.66,150 ක මුදලක් රක්ෂණ සමාගම විසින් රු.63,209 ක් ද, ලබාදුන් අතර, සභාව විසින් ඉතිරි රු.2,941 ක් ගෙවා තිබුණු අතර, එම හානිය සමඟ ම මීට පෙර පැවති සුළු දෝෂයන් සඳහා ද එම අවස්ථාවේදී ම අලුත්වැඩියාවන් සිදු කළ බැවින් රජයට වැයවීමට තිබූ විශාල වියදමක් එමඟින් අවමකර ගත හැකි වූ අතර, ඒ නිසා හානිවීම් ලේඛනයේ ද, පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයේ ද, පොත්වලින් කපාහැරීම් පිළිබඳ ප්‍රකාශයේ ද සටහන් නොකරන ලද බව දන්වා තිබුණි. | යොමුගත මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

## 3.5 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 506 (ඩී) ප්‍රකාරව රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් “බී” ගිණුම් වාර්ෂික සැසඳුම් ප්‍රකාශයේ මුදල් රෙගුලාසි 503(1) යටතේ ගැලපුම් ඉවත් කළ පසු තථ්‍ය අගයන් දක්වා නොතිබුණි. | සැසඳුම් ප්‍රකාශයේ මුදල් රෙගුලාසි 503(1) යටතේ ගැළපුම් ඉවත් කළ තථ්‍ය අගය ද අතපසුවීමකින් දක්වා නොතිබූ අතර, ඉදිරි වර්ෂයේ සිට නිවැරදි කිරීමට පියවරගන්නා බව දන්වා තිබුණි. | සැසඳුම් ප්‍රකාශයේ මුදල් රෙගුලාසි 503(1) යටතේ ගැළපුම් ඉවත්කළ පසු තථ්‍ය අගයයන් දැක්විය යුතු ය. |
| (ආ) | වසර 06 ට වැඩි කාලයක සිට පැවත එන සේවය හැරගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.185,000 ක් වූ ණයශේෂය අයකර ගැනීම සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ xxiv වෙනි පරිච්ඡේදයේ 4.5 හා 4.6 ඡේද ප්‍රකාරව කටයුතුකර නොතිබුණි. | අදාළ නිලධාරියා වෙත ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කරන බව දන්වා යවන ලද අතර, ණයශේෂය පියවීමට 2024 ජූනි 30 දක්වා කාලය ඉල්ලා ඇති බැවින්, එම දිනට පසුව ආයතන සංග්‍රහයේ විධි විධාන අනුව කටයුතු කරන බව දන්වා තිබුණි. | යොමුගත ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | අත්තිකාරම්'බී'ගිණුමේ අමුණුම් 3.1 සේවයේ නියුක්ත නිලධාරින්ගෙන් අයවිය යුතු ශේෂයන් යටතේ එක් නිලධාරිනියකගේ රු.10,000 ක් වූ උත්සව අත්තිකාරම් ශේෂය ණයගැති ලේඛනයේ දක්වා නොතිබුණි. | නිලධාරිනියකගේ උත්සව අත්තිකාරම් ශේෂය වන රු.10,000 ක මුදල ණයගැති ලේඛනයේ සටහන් කරන ලද බව දන්වා තිබුණි. | ණයශේෂ නිවැරදි ලෙස ණයගැති ලේඛනයේ සටහන් කළ යුතු ය. |

## 4. තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අප්‍රේල් 27 දිනැති අංක එම්එස්ඩීඩබ්/08/65 දරන තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද ලිපිය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් 2022 වර්ෂය සඳහා තිරසර සංවර්ධන අරමුණු හා දර්ශක හඳුනාගෙන තිබුණ ද, එම තිරසර සංවර්ධන අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධීකරණය කිරීමට නිලධාරීන් පත්කොට තිරසර සංවර්ධන වැඩසටහනක් පිළියෙල කර නොතිබුණි. | තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද ලිපිය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් 2022 වර්ෂය සඳහා සංවර්ධන අරමුණු හා දර්ශක හඳුනාගෙන එම තිරසර සංවර්ධන අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධීකරණය කිරීමට නිලධාරීන් පත්කොට තිරසර සංවර්ධන වැඩසටහනක් පිළියෙල කිරීම සඳහා කටයුතු කරමින් පවතින බව දන්වා තිබුණි. | යොමුගත ලිපිය පරිදි කටයුතු කළ යුතු ය. |

## 5. යහපාලනය

### 5.1 අභ්‍යන්තර විගණනය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ ඡේද අංක 40(1) ප්‍රකාරව කොමිෂන් සභාව අභ්‍යන්තර විගණන කටයුතු සිදු කිරීම සඳහා එම කොමිෂන් සභාවේ පාලක මණ්ඩලය විසින් පත් කරනු ලබන තමාගේම අභ්‍යන්තර විගණකවරයෙකු සිටිය යුතු නමුත්, කොමිෂන් සභාවේ අනුමත කාර්ය | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය මගින් අධිකරණ සේවා කොමිෂන් සභාව සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවීමට කාර්ය මණ්ඩලය අනුමත කර තිබුණ ද, කොමිෂන් සභාවේ කටයුතු දැනට සිටින කාර්ය මණ්ඩලයටවත් ප්‍රමාණවත් නොවන | ජාතික විගණන පනතේ හා චක්‍රලේඛ ප්‍රකාරව අභ්‍යන්තර විගණන ඒකකය පිහිටුවා ගැනීමට කටයුතු කළ යුතු ය. |

| | | |
|---|---|---|
| මණ්ඩලය තුළ අභ්‍යන්තර විගණක තනතුරක් ඇතුළත්කර නොතිබුණි. තවද, 2019 ජනවාරි 12 දිනැති අංක DMA/01-2019 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයෙහි 03 ඡේදය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ/ ගණන්දීමේ නිලධාරියාගේ සෘජු අධීක්ෂණය යටතේ ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ I පන්තිය නිලධාරියෙකුගේ ප්‍රධානත්වය දරන අභ්‍යන්තර විගණන අංශයක් සියලුම විශේෂ වියදම් ඒකක සඳහා ස්ථාපිත කළ යුතු නමුත්, කොමිෂන් සභාව තුළ අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිතකර නොතිබුණි. | තාවකාලික ගොඩනැඟිල්ලක පවත්වාගෙන යන බැවින් එකී විගණන ඒකකය සඳහා අනුමත කාර්ය මණ්ඩලයට ද ප්‍රමාණවත් ඉඩකඩ නොමැති වීම හේතුවෙන් අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිතකර නොමැති බව දන්වා තිබුණි. | |

## 6. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කොමිෂන් සභාවේ අනුමත කාර්ය මණ්ඩලය 117 ක් වුව ද, දෙසැම්බර් 31 දින වන විට ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 09 ක්, තෘතීයික මට්ටමේ තනතුරු 02 ක් ද, ද්විතීක මට්ටමේ තනතුරු 29 ක් සහ ප්‍රාථමික මට්ටමේ තනතුරු 14 ක ඌනතාවයක් පැවතුණි. | කොමිෂන් සභාවේ කාර්යයන් ඉටු කරගැනීම කෙරෙහි සෘජුවම බලපෑම් ඇති කරනු ලබන තනතුරු 08 ක් සඳහා වන පුරප්පාඩු පූරණය කරගනිමින් රාජකාරී ඉටුකර ගැනීමට කටයුතුකර ඇති බවත්, කොමිෂන් සභාවේ අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා සිටින නිලධාරීන්ගෙන් පුරප්පාඩුව පවතින තනතුරුවලට අයත් රාජකාරී ආවරණය කරගැනීමට කටයුතුකර ඇති බවත්, අවම සේවක සංඛ්‍යාවක් රාජකාරි කළ ද, නිසි කළමනාකරණය සහ පරිපාලනය හේතුවෙන් සියලු රාජකාරි කටයුතු අඛණ්ඩව පවත්වා ගෙන යන අතර, රජයේ මුදල් උපරිම කාර්යක්ෂමතාවයකින් සඵලදායීව විචක්ෂණශීලී මනා මූල්‍ය පාලනයකින් යුතුව භාවිතාකර ඇති බව ද දන්වා තිබුණි. | පුරප්පාඩු සම්පූර්ණ කරගැනීමට කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | අනුමත කාර්ය මණ්ඩලය තුළ නොමැති අධිකරණ රෙජිස්ට්‍රාර් තනතුරු 03 ක් SL 1 වැටුප් තලයෙහි ද, එක් තනතුරක් MN - 6 වැටුප් තලයෙහි ද පිහිටුවා තිබුණි. තවද, අනුමත කාර්ය මණ්ඩලය තුළ ලඝුලේඛන (Court Stenographer) තනතුරු 01 ක් MN 2 වැටුප් තලයෙහි අනුමත කර තිබුණ ද, ඊට අමතරව සත්‍ය කාර්ය මණ්ඩලය තුළ ලඝුලේඛන (Court Stenographer) තනතුරු 01 ක් MN 7 හි වැටුප් තලයෙහි පිහිටුවා තිබුණි. | අනුමත කාර්ය මණ්ඩලයට අයත් නොවන අධිකරණ රෙජිස්ට්‍රාර් තනතුර සඳහා නිලධාරීන් 03 දෙනෙකු සිටින අතර, එම නිලධාරීන් අතරින් එක් නිලධාරියෙකු අධිකරණ රෙජිස්ට්‍රාර් I ශ්‍රේණියට සහ අනිකුත් නිලධාරීන් දෙදෙනා අධිකරණ රෙජිස්ට්‍රාර් II - I ශ්‍රේණියට අයත් නිලධාරීන් බැවින්, ඔවුන්ගේ වැටුප් තලය SL - 1 වේ. එම තනතුර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් අනුමතකර ගැනීම සඳහා අවශ්‍ය පියවර ගනිමින් පවතී. තවද, විශ්වාසවන්තභාවයට ගැළපෙන අයුරින් සේවය කිරීම සුදුසු පළපුරුදු නිලධාරියෙකු ලබාගන්නා තෙක් MN – 7 වැටුප් තලයෙහි (රාජ්‍ය සේවයට නව බඳවාගැනීම් අත්හිටුවා ඇති බැවින්) නිලධාරිනිය මඟින් එම කාර්යය පූරණය කරගැනීමට කටයුතු කර ඇති බව දන්වා තිබුණි. | අනුමත කාර්ය මණ්ඩලය අනුව තනතුරු පිහිටුවිය යුතු ය. |
| (ඇ) | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 01 ඡේදය ප්‍රකාරව සමස්ත කාර්ය මණ්ඩලය සඳහා ම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කිරීම 2018 වර්ෂයේ සිට සිදුකළ යුතු වුවත්, මේ දක්වා ඒ අනුව කටයුතුකර නොතිබුණු අතර, චක්‍රලේඛයේ 04 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්මක් කොමිෂන් සභාව විසින් පිළියෙල කර නොතිබුණි. | මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබූ නමුත් අධිකරණ රෙජිස්ට්‍රාර් සේවයේ සහ උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවාවේ සියලුම තනතුරුවල නිලධාරීන්ගේ කාර්යසාධනය ඇගයීම සඳහා අධිකරණවල කාර්යක්ෂමතාවය සහ සඵලදායීතාවය ඉහළ නැංවීමට තුඩුදෙන වඩාත් ප්‍රායෝගික කාර්යසාධන ඇගයීම් ක්‍රමවේදයක් යෝජනා කිරීම යන අරමුණු ඔස්සේ සමාලෝචනය කර වාර්තා කිරීමට මේ වන විට කමිටුවක් පත්කර එහි කටයුතු අවසන් කර ඇති අතර, අදාළ නිර්දේශ අධිකරණ සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත්කර ඒ අනුව සුදුසු ඉදිරි ක්‍රියාමාර්ග ගනු ලබන බව දන්වා තිබුණි. | යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව මානව සම්පත් සැලැස්මක් සකස් කිරීම හා කාර්යසාධන ගිවිසුම් අත්සන් කළ යුතු ය. |